**විසර්ජන ශීර්ෂය 128 - සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය- 2012**

## 1.1 විගණන විෂය පථය

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ). විසර්ජන ගිණුම

(i). මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.949,865,039 ක් වූ අතර, වර්ෂය අවසාන වනවිට ඉන් රු.834,707,471 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම රු.115,157,568 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.12 ක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනටඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 522,447,000 | 526,490,039 | 19,000,194 | 3.60 |
| මූලධන | 300,475,000 | 423,375,000 | 96,157,374 | 22.71 |
| එකතුව | 822,922,000 | 949,865,039 | 115,157,568 | |

(ආ) <u>අයවැය විචලනය.</u>

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.522,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 20 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ඇ) <u>රාජ්‍ය වියදම් කළමනාකරණය</u>

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මගින් සළසා තිබුණු පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන වලින් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළයුතු විය. ඒ අනුව අමාත්‍යාංශයේ මූලධන වැය විෂයයෙන් රු.405,000 ක් ඉතිරි කළ යුතු වුවත් ඉන් ඉතිරි කර තිබුණේ රු.350,000 ක් පමණි.

(ඇ). රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 12801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 7,500,000 | 5,035,378 | 2,500,000 | 5,171,587 | 25,000,000 | 12,758,317 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). එක් නිලධාරියෙකුට ණය මුදල් ලබාදීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7.3, 3.7.4 , 3.17.3 හා 3.17.5 වගන්ති ප්‍රකාරව කටයුතු නොකිරීම හා එම ණය ලබාදීම පිළිබඳව වගකිව යුතු නිලධාරියාගේ හෝ නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදය හේතුවෙන් රජයට රු.39,538 ක අලාභයක් සිදුවී තිබුණි.

(ii). එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.139,808 ක ණය ශේෂයක් අයකර ගැනීම සම්බන්ධයෙන් ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාල නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම නිසා එම මුදල හා පොළිය 2012 දෙසැම්බර් 31 දින වනවිටත් අයවී නොතිබුණි.

1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.

අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව එම වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

1.4.2 අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණත් අභ්‍යන්තර විගණනය විධිමත්ව සිදු කර නොතිබුණි.

1.5 වත්කම් කළමනාකරණය.

(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්.

අමාත්‍යාංශය විසින් මිලට ගෙන කුරුණෑගල කලාප කාර්යාලය වෙත ලබාදී තිබුණු ඉන්වෙන්ට්‍රි භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් කිසිදු නීත්‍යානුකූල පැවරීමකින් තොරව වෙනත් අමාත්‍යාංශයක් විසින් පරිහරණය කරනු ලබන බව නිරීක්ෂණය වූ අතර, එම හේතුව නිසා ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල අයිතිය හා ආරක්ෂාව පිළිබඳව ගැටළු සහගත විය.

(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(i). කුරුණෑගල දිස්ත්‍රික්කයේ රුක්මලේ මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය වෙත 2012 සැප්තැම්බර් මස ලබාදී තිබුණු රු.359,676 ක් වටිනා මැටි අඹරන යන්ත්‍රය පාවිච්චියට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii). කුරුණෑගල ගුරු පොකුණ වඩු කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සඳහා රු.1,406,060 ක් වැය කර 2010 වර්ෂයේදී ඉදිකිරීම් නිම කරන ලද පොදු පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

1.6 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | මුදල් රෙගුලාසි. 756 සහ 507 (1) | සියළුම වත්කම් වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයට ලක් කළයුතු වුවත්, 2012 වසරේදී අමාත්‍යාංශයේ අංශ 02 ක භාණ්ඩ සමීක්ෂණයට ලක්කර නොතිබුණි. |

(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය — අමාත්‍යාංශය සතු වාහන 30 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

1.7 පාඩු හා හානි
---------------

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) නාරම්මල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ මාරවිට කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය වෙත ලබා දෙන ලද රු.753,700 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ භාවිතයට ගෙන නොතිබීම නිසා මළ බැදී තිබුණි.

(ආ) ගලනිහ සුදු ගම්මිරිස් නිෂ්පාදන ගම්මානයේ ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස අය කළ යුතු රු.68,856 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගලනිහ සුදු ගම්මිරිස් නිෂ්පාදන ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය වෙත විදුලිය ලබා ගැනිමේදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හේතුවෙන් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ධාරිතාවය ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් පොදු පහසුකම් මධ්‍යස්ථානයේ ඇති උපකරණ ක්‍රියා කිරීමට නොහැකිවී තිබුණි.

1.8 අනාර්ථික ගනුදෙනු
----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මාරවිට කොහු ආශ්‍රිත නිෂ්පාදනය වෙනුවෙන් ඉදිකරන ලද පොදු පහසුකම් මධ්‍යස්ථානය හා එහි උපකරණ භාවිතයට නොගැනීම නිසා ඒ සඳහා 2012 දෙසැම්බර් 31 දිනට වැය කරන ලද රු.12,774,295 ක් ඵල රහිත වියදමක් බවට පත්වී තිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංගන්දළුව මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ පවත්වාගෙන යන පොදු පහසුකම් මධ්‍යස්ථානය වෙත නැවත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය මගින් 2012 වර්ෂයේදී රු.1,411,937 ක් වැයකර ලබාදී තිබුනු සකපෝරු අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් නිෂ්ක්‍රියව පැවතුණි.

## 1.9 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) යම් භාණ්ඩයක් හෝ සේවාවක් ලබා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදිය යුතු වුවද, 2012 වර්ෂයේ දී ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා පළ කළ පුවත් පත් දැන්වීමෙහි මෙම අවශ්‍යතාවය සපුරා නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2012 ජනවාරි සිට 2012 සැප්තැම්බර් 30 දින දක්වා කාල පරිච්ඡේදයකට ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා රු.820,480 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

(ඇ) මාරවිට කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයට විදුලිය හා ජලය සැපයීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු සිදුවී තිබුණි.

(i) මාරවිට කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයට විදුලිය සැපයීම සඳහා රු.4,949,350 ක මුදලක් විදුලිබල මණ්ඩලය වෙත (ට්‍රාන්ස්පෝමරයක් සවි කිරීම ඇතුළුව) 2010 දෙසැම්බර් 31 දින ගෙවා මාස 25 ක කාලයක් ගතවී තිබුණත්, මධ්‍යස්ථානය වෙත විදුලිය ලබාදී නොතිබුණි.

(ii) කොහු ආශ්‍රිත නිෂ්පාදන ඉහළ ජල අවශ්‍යතාවයක් පවතින කර්මාන්තයක් වුවද, ලිං හෝ නල ජලය හෝ කිසිදු විකල්ප ක්‍රමයකින්වත් ජල සැපයුමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ඉහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්පාදන සමුපකාර සමිතියක් පිහිටුවාගෙන නොතිබුණු අතර, උපකරණ සවිකර තිබුණද මධ්‍යස්ථානය වසා දමා තිබුණි.

(ඈ) මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානවල පොදු පහසුකම් සැපයීම්වල පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

(i) සුධීරගම මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයෙහි පොදු පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි කොටසක් කිසිදු අනුමැතියකින් තොරව ග්‍රාමසේවා නිලධාරියෙකු සඳහා වෙන්කරදී තිබුණි.

(ii) සිංගන්දළුව මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය ඉදිකිරීම සඳහා රු.3,762,431 ක් වැය කර තිබුණු අතර, අමු ද්‍රව්‍ය හිඟකම, වෙළෙඳපොල නොමැතිකම, හා නිෂ්පාදිත භාණ්ඩ නවීන වෙළෙඳපොළට නොගැලපීම යන හේතු මත මෙම ආයෝජනය ඵල රහිත වී තිබුණි .

(ඉ) ගලනිහ සුදු ගම්මිරිස් නිෂ්පාදන ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය හා කොටවෙහෙර ගුරුපොකුණ පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකරීම සඳහා පිළිවෙලින් රු.925,000 ක් හා රු.1,406,060 ක් වැය කර තිබුණද එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කුරුණෑගල පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද්දෙපොල පන් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ නිෂ්පාදන කටයුතුවල නියැලෙන සාමාජිකයන් 20 න් 07 දෙනෙකු පමණක් අමාත්‍යාංශයේ ප්‍රතිලාභීන් වී තිබුණි. ඔවුන් වෙනුවෙන් වූ සමුපකාර සමිතියද අක්‍රියව පැවතුණු අතර මෙම ප්‍රතිලාභීන්ගෙන් අය කරනු ලබන සාමාජික මුදල්ද ජාතික ශිල්ප සභාවේ අරමුදලට අයකර ගන්නා බැවින් අමාත්‍යාංශය වෙනුවෙන් චක්‍රීය අරමුදලක් ගොඩ නැගී නොතිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 11 | 07 | - |
| තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| ද්විතියික මට්ටම | 396 | 58 | 338 | - |
| ප්‍රාථමික මට්ටම | 31 | 28 | 03 | - |
| වෙනත්, (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 06 | - | 01 |
| | 453 | 104 | 350 | 01 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 350 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.